# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# පූරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා සුදුස්සන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් 2025.02.05 දින දක්වා භාර ගනු ලැබේ.

**දෘශ්‍ය කලා පීඨය**

**අධ්‍යයනාංශ :** මූර්ති කලා අධ්‍යයනාංශය

**අයදුම්කරුවන් සඳහා උපදෙස් :**

1. උක්ත තනතුර සඳහා වන අයදුම්පත්, අදාළ සුදුසුකම් සහ වෙනත් අදාළ විස්තර විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.vpa.lk) ලබා ගත හැකිය.
2. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.02.05 දින ප.ව.4.00ට හෝ ඊට ප්‍රථම **"සහකාර ලේඛකාධිකාරි/දෘශ්‍ය කලා පීඨය නොː 46, හෝර්ටන් පෙදෙස, කොළඹ 07."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර, විෂය සහ අධ්‍යයනාංශය පැහැදිලිව සඳහන් කළ යුතුය.
3. අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණු සනාථ කෙරෙන සේවා සහතික ඇතුළු අදාළ සියලු සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. අදාළ සහතික පත්‍ර පිටපත් අමුණා නොමැති අයදුම්පත් අසම්පූර්ණ ලෙස සැලකෙන අතර ඇගයීමට භාජනය නොවෙනු ඇත.
4. රාජ්‍ය සේවයේ සහ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධාන මඟින් එවිය යුතුය.
5. ඉහත 1, 2, 3, 4 කරුණු අසම්පූර්ණ, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## දෘශ්‍ය කලා පීඨය

අධ්‍යයනාංශය : මූර්ති කලා අධ්‍යයනාංශය

විශේෂ සුදුසුකම් : මූර්ති කලා විෂය සඳහා අයදුම්කරන අයදුම්කරුවන් ඇඹීම, ජීව චිත්‍ර ඇඳීම විවිධ වාත්තු ක්‍රම හා පැස්සුම් ක්‍රම පිළිබඳ පළපුරුද්ද හා මූර්ති කලා විෂය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සහිත වූවන් විය යුතුය.

<u>කථිකාචාර්ය (තාවකාලික) තනතුර අදාළ මූලික සුදුසුකම්</u>

1. අදාළ විෂයෙන් ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමර්ථයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

2. අදාළ විෂයෙන් දෙවන පෙළ (පහළ) ගෞරව සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

3. (a) ගෞරව සාමර්ථයක් රහිතව අදාළ විෂයෙන් ලබා ගත් විශේෂ උපාධියක් හෝ අවම වශයෙන් දෙවන පෙළ සාමර්ථයක් සහිතව වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

(b) (i) අදාළ විෂයෙන් ලබාගත් දර්ශනශූරි උපාධියක්

හෝ

(ii) අදාළ විෂයෙන් ලබා ගත් පර්යේෂණ සහිත පූර්ණ කාලීන අවම වශයෙන් මාස 24ක (හෝ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) ශාස්ත්‍රපති උපාධියක්

හෝ

(iii) අදාළ විෂයෙන් ලබාගත් පූර්ණ කාලීන අවම වශයෙන් මාස 18 ක කාලසීමාවකින් යුත් සම්භාර 15කට නොඅඩු පර්යේෂණයක් සහිත අවම වශයෙන් සම්භාර 60ක ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම.

හෝ

4. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් අධ්‍යයන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

ලේඛකාධිකාරී<br>
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>
2025.01.14